**<u>බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව</u>**

**<u>කළුතර දිස්ත්‍රික්කය</u>**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 14 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන වැය විෂයය 209 යටතේ කසල කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම හා සුසාන භූමිය වටා තාප්පය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දරා ඇති රු.1,570,813 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් ඉඩම් ගොඩනැගිලි ගිණුම රු.1,570,813 කින් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම රු.1,570,813 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2014 වර්ෂයේදී මිලදී ගත් රු.231,250 ක් වටිනා ලී බඩු උපකරණ වෙනුයවන් ණයහිමියන් ලෙස වෙන් කිරීම් කර නොමැති අතර එය සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම රු.231,250 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී 509 වැය විෂයය යටතේ පොදු වෙළඳ පොල උඩුමහලේ විදුලි නඩත්තු කටයුතු සඳහා උපකරණ මිලදී ගැනීම සඳහා දරා තිබූ රු.238,980 ක මුදල පුනරාවර්තන වැය යටතේ දැක්විය යුතු වුවත් ප්‍රාග්ධන වැය යටතේ දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගත හැකි උපයෝගී සේවා ගිණුමේ තිබිය යුතු ශේෂය රු.353,365 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.3,531,822 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් උපයෝගී සේවා ගිණුමේ ශේෂය රු.3,178,457 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් සභා ණය ගිණුමේ තිබිය යුතු ශේෂය රු.353,365 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.1,677,856 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් පළාත් සභා ණය ගිණුමේ ශේෂය රු.1,324,491 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැති වටිනාකම රු.4,174,653 ක් වුවත් 2015 වර්ෂයේදී මුදල් ලැබී තිබූ කර්මාන්ත 04 කට අදාලව රු.2,026,026 ක් හා රු.48,450 ක් වටිනා සහා කර්මාන්ත 01 කට අදාල වටිනාකම්ද එකතු කර කර්මාන්ත ණයගැති ශේෂය රු.6,249,129 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් කර්මාන්ත ණයගැති වටිනාකම රු.2,074,476 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ආධාර වටිනාකම රු.13,071,694 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.15,195,596 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ප්‍රාග්ධන ආධාර වටිනාකම රු.2,123,902 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාග්ධන වියදම රු.32,999,401 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල 2013 වර්ෂයට අදාලව කර්මාන්ත දෙකක් සඳහා ගෙවිය යුතු රු.49,427 ක් සහ ණයහිමි වටිනාකම එකතු කර රු.33,048,828 ක් ලෙස දක්වා තිබීමෙන් ප්‍රාග්ධන වියදම රු.49,427 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.1,499,788 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් යටතේ ගිණුම් ගත කර නොතිබීම හේතුවෙන් ණයහිමි වටිනාකම රු.1,499,788 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) 2015 වර්ෂයේ ලිබඩු උපකරණ හා සවිකිරීම් මිලදී ගැනීම් රු.742,065 ක් වුවත් රු.1,705,651 ක් ලෙස ලිබඩු උපකරණ හා සවිකිරීම් ගිණුමට හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට සටහන් කිරීම හේතුවෙන් එම ගිණුම් රු.963,586 ක් බැගින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) රු.48,136 ක් වූ පුස්තකාල පොත් ඉවත්කිරීම් පුස්තකාල පොත් ගිණුමෙන් ඉවත්නොකිරීම හේතුවෙන් පුස්තකාල පොත් ගිණුමේ ශේෂය රු.48,136 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොලිය රු.1,461,171 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.1,803,764 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.342,593 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හා උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.63,535,065 ක් වූ ගිණුම් විෂයයන් 3 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 <u>නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්</u>

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 396(ඇ) අනුව බැංකු ජංගම ගිණුම් අංක 121-1-001-0-4024069 (මහජන බැංකුව) ට අදාලව 2015 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 6 ඉක්මවූ රු.172,651 ක් වටිනා චෙක්පත් 43 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායමට වඩා වැඩි වූ පුනරාවර්තන වියදම රු.25,439,399 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායමට වඩා වැඩි වූ පුනරාවර්තන වියදම රු.22,362,074 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.3,242,126 ක් වූ හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තියේ විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

#### **2.2.2** වරිපනම් බදු

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.2,846,035 ක හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.1,655,654 ක් හෙවත් සියයට 58 ක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කළ ආදායම රු.3,650,506 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ඉන් රු.2,116,724 ක් හෙවත් සියයට 58 ක් අයකරගෙන තිබුණි.

#### **2.2.3** ව්‍යාපාර බදු

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.169,660 ක හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.158,260 ක් හෙවත් සියයට 93 ක් අයකරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා බිල් කිරීම රු.2,737,430 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.2,536,120 ක් හෙවත් සියයට 93 ක් අයකරගෙන තිබුණි.

(ආ) ව්‍යාපාර බදු වර්ෂයක් ආරම්භ වී පළමු මාස තුන ඇතුළත බදු අය කර ගත යුතු වුවත් ව්‍යාපාර බදු ගෙවූ ව්‍යාපාර 843 කින් 568 ක් මාර්තු මාසයෙන් පසු බදු මුදල් අයකරගෙන තිබුණි.

#### **2.2.4** කර්මාන්ත බදු

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.68,750 ක හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.48,250 ක් හෙවත් සියයට 70 ක් අයකරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා බිල් කිරීම රු.782,800 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.758,800 ක් හෙවත් සියයට 97 ක් අයකරගෙන තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා පනතට අනුව මුල් මාස 03 ඇතුළත බදු මුදල් ලබා ගත යුතු වුවත්, කර්මාන්ත බදු ලබාගන්නා ලද 204 දෙනෙකු 2015 අප්‍රේල් මාසයෙන් පසු සභාවට බදු ගෙවීම් කර තිබුණි.

### 2.2.5 කඩකුලී

(අ) අධිකාරීපත්තු උප කාර්යාල බල ප්‍රදේශයේ පොදු වෙළඳපොල කඩකාමර 21 න් 10 ක් සඳහාම ගිවිසුම් ගතවී නොතිබූ අතර රු.725 සිට රු.1,050 දක්වා මාසික කුලියක් සභාව අයකරගෙන තිබුණි.

(ආ) කඩකාමර අංක 19, 20, 21 හි පිළිවෙලින් බදුකරුවන් දෙදෙනෙක් පොදු වෙළඳසැල් කඩකාමරවල ව්‍යාපාරික කටයුතු කරගෙන ගියද සභාව කිසිදු කුලියක් අයකර ගෙන නොතිබුණි.

(ඇ) නව වෙළඳපොල කඩකාමර 23 න් 04 ක් පමණක් පිළිවෙලින් මාසික කුලිය රු.600 බැගින් දෙදෙනෙකුටද රු.1,200 බැගින් එක් අයෙකුටද, රු.1,500 බැගින් එක් අයෙකුටද ලබාදී තිබුණි.

(ඈ) පොදු වෙළඳපොල කඩකාමර 21 න් 10 ක් හා නව වෙළඳපොල කඩකාමර 23 න් 19 ක ගිවිසුම් අවුරුදු 2 සිට 8 දක්වා කාල පරාසයක කල් ඉකුත් වී තිබුණද එම ගිවිසුම් අළුත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඉ) 1980 දෙසැම්බර් 03 දිනැති බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1980/46 දරන චක්‍රලේඛයේ 07 ඡේදයේ විධිවිධානවලට පටහැනිව පොදු වෙළඳපොල කඩකාමර 21 න් 10 ක්ද, නව වෙළඳපොලේ කඩකාමර 23 න් 10 ක්ද අතුරු බදුදී තිබුණි.

### 2.2.6 ඉඩම් විකිණීම් මත බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කරනු ලබන ඉඩම්වල විකුණුම් මිලෙන් සියයට එකක ආදායමක් සභාව විසින් ලබා ගත යුතු වුවත් එසේ සිදු නොකර සභාවේ ආදායම් පරිපාලක විසින් සකස් කර තිබූ දල ඇස්තමේන්තුවෙන් සියයට එකක මුදල වශයෙන් රු.1,349,122 ක් ඉඩම් විකිණීම් 14 කින් 2015 වර්ෂයේදී ලබාගෙන තිබූ අතර දල ඇස්තමේන්තුව හා වෙළඳපොල විකුණුම් වටිනාකම අතර වෙනස සළකා ඉතිරි මුදල් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.7 ප්‍රචාරක දැන්වීම් ගාස්තු

2014 දෙසැම්බර් 19 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ අංක 12-58/2 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ 2013 වර්ෂයට අදාල ප්‍රචාරක දැන්වීම් පිළිබඳ නිවේදනය අනුව ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදි කිරීම සහ ප්‍රදර්ශණය කිරීම වෙනුවෙන් දක්වා ඇති පරිදි ගාස්තු අය කළ යුතු වුවත් 2015 නොවැම්බර් 19 දින කරන ලද නියැදි භෞතික පරීක්ෂාවට ලක් වූ ගාස්තු අය කළ යුතු ප්‍රචාරක දැන්වීම්/නාම පුවරු 25 ක් සඳහා අදාල ගාස්තු අයකිරීමට සභාව කටයුතු නොකිරීම නිසා සභාවට සමාලෝචිත වර්ෂය තුළ නොලැබූ ආදායම රු.149,700 ක් විය.

2.2.8 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 63,298,082 ක මුදලක් පහත පරිදි ලැබිය යුතුව තිබුණි.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 6,326,485 |
| මුද්දර ගාස්තු | 56,971,597 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.1,499,788 ක හිඟ විශ්‍රාම වැටුප් දායකය 2016 ජුනි 15 දින වන විටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ) 2011 පෙබරවාරි 24 දිනැති විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2/2011 දරන චක්‍රලේඛයේ 4.1 වගන්තියට අනුව අනියම් හා තාවකාලික සේවකයින්ගේ දායක මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලේකම් හා ගණකාධිකාරි වෙත එවීමට කටයුතු කළ යුතු වුවත් එසේ නොකොට සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාර අරමුදල වෙත ප්‍රමාද වී ප්‍රේෂණය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.18,139 ක් අරමුදල වෙත දඩ මුදල් වශයෙන් ගෙවා තිබුණි.

(ඇ) අනතුරුවලින් සිදු වූ හානි යථා තත්ත්වයට පත්කිරීම සඳහා වාහන 04 ක් වෙනුවෙන් අළුත්වැඩියාව සඳහා සභාවට දැරීමට සිදු වූ වියදම රු.224,865 ක් වූ නමුත් එම වාහන සඳහා රක්ෂණ වන්දි වශයෙන් ලැබී තිබුණේ රු.193,714 ක් පමණක් වූ බැවින් සභාව මගින් දැරූ රු.31,151 ක වියදම අදාල වග කිව යුත්තන්ගෙන් අයකරගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාලවල පොත් බැහැර දෙන අංශයෙන් පාඨකයින් විසින් 1993 වර්ෂයේ සිට 2015 මැයි මාසය දක්වා ලබාගෙන ආපසු භාර නුදුන් පොත් 346 ක වටිනාකම රු.66,294 ක් වූ අතර පොත් ආපසු ලබාගැනීමට හෝ ඒවායේ වටිනාකම අදාල පාර්ශවයන්ගෙන් අයකරගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

2004 දෙසැම්බර් 15 දිනැති අංක LG/07/2004 දරන පළාත් පාලන කොමසාරිස්වරයාගේ චක්‍රලේඛයේ 15 ඡේදයේ විධිවිධානවලට පටහැනිව 2015 ජනවාරි සහ ජූලි මාස තුළ රාජකාරි වේලාවෙන් පසු පැය 02 කට අඩුවෙන් සැලසුම් කමිටු පවත්වා තිබූ දින ගණන 14 ක් වූ අතර ඒ සඳහා රු.60,750 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි.

3.3 මානව සම්පත් කළමණාකරනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) තනතුරු 23 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය 192 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 205 ක් විය.

(ii) අනුමත තනතුරු 03 ක පුරප්පාඩු 03 ක් පවතින අතර තනතුරු 03 ක් සඳහා 18 දෙනෙකු අතිරික්තව පැවතුණි.

3.4 **<u>කොන්ත්‍රාත් පාලනය.</u>**

**<u>කුරුළු උයන ප්‍රජාශාලාව ඉදිකිරීම</u>**

2015 ජනවාරි 16 දින වැඩ අවසන් කර තිබූ ප්‍රජාශාලාව විගණිත දිනය වූ 2015 නොවැම්බර් 20 දින වන විටත් කිසිදු කර්යයක් සඳහා ප්‍රයෝජනයට ගැනීමකින් තොරව වසා දමා තිබූ අතර ශාලාව ඇතුළත ගෙබිම හා අවට දැඩි ලෙස අපවිත්‍රව පැවතුණි. ශාලාව තුළට ගවයන් පවා ඇතුළු වී ඇති බවට කරුණු නිරීක්ෂණය විය.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) මානව සම්පත් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පාලනය

(ඊ) වත්කම් කළමනාකරණය